# කහඹිලියාව ටෙරාකොටා රූප

**සීවලී බණ්ඩාර මනතුංග**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය
*seevali.manatunge@yahoo.com*

## හැඳින්වීම

ටෙරාකොටා හෙවත් පුළුස්සු මැටි රූප කලා මාධ්‍යයක් ලෙස ග්‍රාම්‍ය වූ පොදු ජන සංස්කෘතියක් නියෝජනය කරයි. ශ්‍රී ලංකාවේ මෙ වැනි රූප හමු වී ඇති ස්ථාන සියල්ල ම වැව් පිටි කුඹුරු හා ආසන්න කැලෑවලට අයත් ය. මේවා වියළි දේශගුණයක් ඇති කෘෂිකර්මය ප්‍රධාන ජීවනෝපාය වූ ප්‍රදේශ වේ. මැදිරිගිරිය-දියසෙන්පුර කහඹිලියාව බෝධිරුක්ඛාරාම පුරාණ විහාරය සතු ව ඇති රූප කීපය ද මෙම සංස්කෘතිය නියෝජනය කරයි. සත්ත්ව රූප මනුෂ්‍යාකාර හා ලිංගාකාර හැඩැති මේවා හොඳින් පිළිස්සූ වැලි මිශ්‍ර මැටිවෙන් තනා ඇත. මෙම පත්‍රිකාව ලංකාවේ මෙ තෙක් හමු ව ඇති ග්‍රාම්‍ය ටෙරාකොටා රූප සම්බන්ධයෙන් දී ඇති විවිධ නිර්වචන හා කහඹිලියාවේ රූප එකතුව සන්සන්දනය කර බැලීමටත් ඒ හා බැඳුණු ගැමි අභිචාර පසු කලක දි කාලීන ව වෙනස් මගක් ගත් අයුරු පිළිබඳ ව සොයා බැලීමටත් කරන ලද උත්සාහයකි.

## පර්යේෂණ ගැටලුව

විහාර බිමේ ඉදිකිරීම් අතරතුර දී හමු වී හා ප්‍රදේශයේ කුඹුරු ඉඩම් හා ගෙවතු ආශ්‍රිත ව හමු වී මහජනයා විසින් වරින්වර විහාරස්ථානයට ගෙනවුත් දී ඇති දහස් ගණනක් භාජන කැබළි අතුරෙන් වෙන් කර හඳුනාගන්නා ලද මේවා පිළිබඳ ව මෙ තෙක් ප්‍රකාශයට පත් වූ විධිමත් වාර්තාවක් හෝ විශ්ලේෂණයක් නොමැත. ශ්‍රී ලංකාවේ මෙ තෙක් හමු ව ඇති ග්‍රාම්‍ය ටෙරාකොටා රූප එකතුන් සමග සමානතාවක් ඇත් ද, ඒවා සම්බන්ධයෙන් දී ඇති නිර්වචන හා ගැලපේ ද, යන්න සන්සන්දනය කර බැලිය යුතු වි ය.

## පර්යේෂණ ක්‍රමවේදය

විහාරස්ථාන භූමියේ තැනින්තැන හමු වූ වළං කැබළි රාශියක් සමග ටෙරාකොටා රූප මිශ්‍ර ව තිබූ බැවින් ප්‍රථමයෙන් රූප වෙන් කර ගන්නා ලදී පසු ව මිනිස්, සත්ව හා වෙනත් රූප ලෙස ද ඒවායේ අංග ලක්ෂණ අනුව ස්ත්‍රී හා පුරුෂ රූප ලෙස ද වෙන් කෙරිණ. අනතුරු ව ශ්‍රී ලංකාවෙන් මෙ තෙක් හමු වී ඇති ටෙරාකොටා රූප සම්බන්ධයෙන් පළ වී ඇති වාර්තා අදහස් හා නිගමන සමග එකී රූප සංසන්දනය කරන ලදී.

## කහඹිලියාව එකතුව

ප්‍රස්තුත මාතෘකාවට අදාල මිනිස් පෙනුමැති රූප 4ක් ද සත්ව රූපයක් හා ලිංගාකාර රූප 3ක් වෙන් කර පහසුවෙන් හඳුනා ගත හැකි වි ය.

2.1 මනුෂ්‍යාකාර රූපය 1

උස මි. මී. 73ක් ද පලළ මී. මී. 59ක් වූ මුහුණකි. හිස මුදුනේ පැතලි කරන ලද තලප්පාවකි. හිස පැතලි ය එහි වම් පසින් මඳක් හින්න වී තිබේ හිස් වැස්මට ම ඇඳන ලද පෙත්තක් වැනි වැස්මක් හිස දෙ පසින් වේ. කන් පෙති යුගලය මෙම පෙනෙන්නට නැත. ඇස් දිගැටි ය. සහල් ඇටයක හැඩය ඇති එය ඉරටක් වැනි දෙයකින් ඇඳ සකස් කර ඇත. පැතලි පෙනුමින් යුත් නාසය පුඩු අසළින් මඳක් ඉහළට එස වී තිබේ. මුඛය හැඟීම් විරහිත ය. නිකට අපැහැදිළි ය. ගෙල

කොටසේ යටින් මි. මී. 13ක විෂ්කම්භයක් ඇති සිදුරකි.

2.2 මනුෂ්‍යාකාර රූපය 2
මුහුණ පමණක් ඇති රුවකි. හිස පැතලි කැපුමක් මෙනි. එහි මුදුනේ මි.මී. 4ක් පුළුල් වූ 30ක් ගැඹුරු සිදුරකි. ඇතැම් විට එහි යම් සැරසිල්ලක් සවි කර තිබෙන්නට ඇත. හිස් වැස්මේ ඉදිරියේ කොටු මෝස්තරයකි. මෙම රුවෙහි දෑස් මතු කර නොදක්වා ඇස් බැම් පමණක් මතු කර ඇත. නාසය සෘජු ය, දිගැටි ය. වම් කනේ පමණක් කර්ණාභරණයක් ඇති ලෙස රවුම් කර ඇතත් දකුණු කන හිතාමතා ම නිර්මාණය කර නැත. මෙහි තොල් මහත් ය. හැඟීම් විරහිත ය. හිසට ම ඇලුණු ගෙලත් සිලින්ඩරාකාර ව සකස් කළ කඳත් වෙන් කර හඳුනා ගැනීම අසීරු ය. කඳෙහි පහත කෙළවර සිටුවීමට පහසු වන පරිදි පැතලි ව තනා තිබේ. එහි මි.මී. 20ක් පලළ වූ ද මි.මී. 42ක් ගැඹුරු වූ ද සිදුරකි. රූපයේ සම්පූර්ණ උස මි.මී. 84 කි. පලළ මි.මී. 47ක් වේ.

2.3 මනුෂ්‍යාකාර රූපය 3
මෙම මුහුණ මි.මී. 73ක් උස් වූ ද මි. මී. 60ක් පලළ වේ. ගෙලෙහි යටි පැත්තෙන් මි.මී. 20ක් ගැඹුරු සිදුරකි. කෝණාකාර වන සේ ගොඩ නගා ඇති හිස මුදුනින් කැඩී ඇත. පැතලි වූ මුහුණේ ඇත්තේ ඇතුළට එබී ගිය නාසයකි. එහි නාස් පුඩු නොපෙනෙයි. දෑස් වටකුරු ය. වම් කන පැහැදිළි ව හිසට ම ඇලී සිටින සේ තනා ඇත. දකුණු කන සකස් කර නොමැත. මුඛය කෙටි වූ ද කෝණාකාර වූ ද එකකි. එය පෙනෙන්නේ මඳ සිනහවක් ඇති පරිදි ය.

2.4 මනුෂ්‍යාකාර රූපය 4 (ස්ත්‍රී රුව)
රවුම් පැතලි මුහුණක් සහිත මෙහි හිස පසුපසින් ගොනු කළ කෙස් කළඹක් ද, පයෝධර යුගලය ද වෙයි. මුහුණේ දෙපස පැතලි බව වැඩි කර ඇත. ඉදිරියට නෙරූ පුළුල් නිකට ද පැතලි වේ. මෙහි දෙනෙත් හෝ දෙනෙත් කෙවෙණි ඇත්තේ ම නැත. කන් යුගලය ද නැතත් ඉදිරියට නෙරූ පැතලි නාසයක් වෙයි. සිනහව සහිත පුළුල් මුඛය දෙපසට විහිදෙයි. මි.මී. 55ක් පුළුල් මුහුණ උඩු අතට හරවා නිර්මාණය කර තිබේ. මෙය උරහිස අසළින් බිඳී ගිය රූපයක් බැවින් එය දෑත් සහිත ව නිර්මාණය කළ එකක් දැයි සැක සහිත ය. මි.මී. 25ක් විෂ්කම්භය ඇති පැහැදිළි ගෙලක් ද අවිධිමත් ව ඉදිරියට නෙරූ පයෝධර යුගලයක් ද වෙයි. මි.මී. 170ක් උස් වූ මෙම රූපය ක්‍රමයෙන් පහතට යත් ම පුළුල් වේ. මි.මී. 65ක් වන ඉඟටිය සිටුවීමේ පහසුව පිණිස පුළුල් ව තනා ඇත.

2.5 මනුෂ්‍යාකාර රූපය 5 (ස්ත්‍රීරුව 2)
උස මි.මී. 4ක් සහ පලළ මි.මී. 25ක් වන මෙය ද ස්ත්‍රී ලක්ෂණ සහිත ය. ගෙල සහ අත් විරහිත ය. ඒවා බොහෝ කලකට පෙර බිඳී ගොස් ඇති බව පෙනෙන්නේ එ තැන් බොහෝ ගෙවී ගොස් ඇති බැවිනි. ඉඟටියෙන් පහළට නිර්මාණය වූ බවක් නොපෙනෙයි. මෙම රූපයේ ඇති විශේෂත්වය වන්නේ සිරුරට අවතල ව එබී ගිය පයෝධර යුගලයකින් යුක්ත වීම යි. එය හිතාමතා ම විකෘති කර යම් සංකේතාර්ථයක් දැක්වීමට උත්සහ කර තිබෙන බව පෙනෙයි. මතු පිට පස්තට්ටුවකට යට වී කලක් පැවතීම හේතුවෙන් අඳුරු පැහැයක් ගන්නා මෙම රූපයේ ද මැට්ට සේදී යාමෙන් මතු වූ වැලි කැට හොඳින් පෙනෙයි.

2.6 සත්ත්ව රූපය (අශ්ව හිස)
ගෙල අසළින් කැඩී ඇති එ සේ ම තරමක් ගෙවී ගොස් ඇති කුඩා සත්ත්ව රුවක කොටසකි. මි.මී. 30×35 ප්‍රමාණයේ දිග පලළකින් යුත් මෙහි බාහිර ලක්ෂණ අනුව අශ්ව මුහුණකට සමාන ය. කන් යුගලයක් හිස මුදුනේ යම් තරමකට මතු වී ඇතත් එය කැඩී බෙහෙවින් ගෙවී ගොස් ඇත. ඇස ඕවලාකාර ව සිහින් ඉරටුවක් වැන්නකින් ඇඳ සකස් කර ඇත.

2.7 ලිංග රූප
රතු-තැඹිලි පැහැයට හුරු මේවා බෙහෙවින් සරළ තාත්විකත්වයට සමීප නිර්මාණ වේ. පුරුෂ ලිංග නිමිති ලෙස පහසුවෙන් හඳුනාගත හැක්කේ ශිෂ්ණ මුණ්ඩය පැහැදිළි ව දක්වා තිබීම හේතුවෙනි. ඒවා සිලින්ඩරාකාර වූ ද මඳක් වක්‍ර වූ ද නිර්මාණ වේ. මෙයින් එකක් දිගින් මි.මී. 97ක් ද මි.මී. 34ක් ඝනකම් ද වූවකි. එය එහි මූලයෙන් බිඳී ඇත. එම පැහැයෙන් ම යුත් අනෙක් රුව දිගින් මි.මී. 110ක් හා ඝනකමින් මි.මී. 30ක් වූවකි. එය අගින් මඳක් වක්‍ර ය. පෙනුමෙන් බොහෝ සරළ වේ. දෙ

කෙළවරින් ම කැඩී ගිය මි.මී. 65ක් දික් වූ ද, මි. මී. 30ක් ඝනකම් ද වූ අනෙක ලිංගයක කොටසකි. එහි ද ශිෂ්ණ මුණ්ඩයේ කොටසක් මඳක් පැහැදිලි ව පෙනෙයි.

**සාරාංශය**

ඉහත සඳහන් කරන ලද රූප මෙ තෙක් ශ්‍රී ලංකාවේ හමු වී ඇති මෙ වැනි රූප හා බොහෝ අංගවලින් සමානකම් ඇත. පොදුවේ මේ රූප උතුරු, උතුරු මැද, වයඹ, නැගෙනහිර හා මාතලේ දිස්ත්‍රික්කයේ උතුරු බද වියළි ග්‍රාමීය වැව් හා කුඹුරු ආශ්‍රිත ප්‍රදේශවලට අයත් ය.

කහඹිලියාව රූපවලින් සතර දුගතියට අයත් ප්‍රේතයින් පෙන්නුම් කළා විය හැකි ය. මොවුන් සමග ඇති සත්ත්ව රූප මගින් තවත් දුගතියක් ලෙස ගැනෙන තිරිසන් ලෝකය පෙන්නුම් කරන්නට ඇත. පෙනෙන හා නොපෙනෙන වගා හානි කාරකයන් (ප්‍රේතයින් හා සතුන්) මෙ ලෙස සංකේතාකාර ව පිදේනි පිදිමක් සිදු කෙරෙන්නට ඇත.

මේ සමග ම හමුවන ලිංගාකාර රූප ලිංග ඇදහීමේ සංස්කෘතියකට අයත් (Phallic Culture) (Deraniyagala, 1972:164) අයත් වන්නට ඇත. ඇලහැර හත්තොට අමුණ මොරතැන්නෙන් ද (දිසානායක, 1992:9) සීගිරිය ඉළුක් වැව සහ ඉනාමළුවෙන් ද මිනිස් මුහුණු යෙදූ ලිංග රූප හමු වී තිබේ (දැරණියගල, 1958:19, ද සිල්වා 1980:5).

මෙම සංස්කෘතිය රේඩියෝ කාබන් සහ තාපසංදීප්තතා ක්‍රමවලට දින නියම වී ඇත්තේ වර්ෂ 900-1300ත් අතරට ය (Deraniyagala 1997:33). මෙම කාලය දිවයිනට දකුණු ඉන්දිය බලපෑම තදින් ම එල්ල වී අනුරාධපුර රාජධානිය බිඳවැටී හින්දු ඇදහිලි වඩාත් පැතිර ගියේ මෙම යුගයේ දී ය. ආළහණ පරිවෙණ (ප්‍රේමතිලක, 1982:29), මැදිරිගිරිය-කහඹිලියාව, සෝමාවතිය-ගල්කැටිදමන, ඇලහැර-හත්තොට අමුණ (දිසානායක 1992:9) සීගිරිය-මානාවැව, ඉනාමළුව, ඉලුක්වැව (ද සිල්වා 1980:5), වැනි ස්ථාන වඩාත් සමීප වන්නේ මෙම කාලවකවානුවේ රාජධානිය ව පැවති පොළොන්නරුවට ය. රාජාංගනයේ වීරපොකුණ, මහඔය 28 කණුව (ද සිල්වා 1980:164), මහව-කුඹුක් වැව (දිසානායක 2001:166) ද වියළි කළාපයට අයත් සමීප ප්‍රදේශ වේ. එ බැවින් මෙම රූප සංස්කෘතිය තබ්බෝව-මරදන්මඩුව හෝ මානාවැව-ඉළුක්වැව සංස්කෘතිය ලෙස එක් එක් ප්‍රදේශවලට සීමා කර හැඳින්වීම වැරදි සහගත ය. අතීතයේ සිට ම හුදෙක් සශ්‍රීකත්වය පතා සිදු කළ ඇදහිල්ලට පසුව ලිංග ඇදහිල්ල ද එක් වන්නට ඇත. ඒ අනුව විකෘති රූප හා සත්ත්ව රූප එකතුන් මුල් අවධිවලටත් ලිංග රූප සමග හමුවන එකතුන් වඩා මෑත කාලයටත් අයත් විය හැකි ය. ක්‍රමයෙන් කාලානුරූප ව ප්‍රධාන සමාජ ධාරාවේ ප්‍රබලත්වය තුළ ලිංග ඇදහිල්ල ක්‍රමයෙන් ගිලී යන්නට ඇත. වර්තමානයේ මෙම ප්‍රදේශවල හෝ සෙසු කෘෂි සමාජවල මෙ වැනි ලිංග ඇදහිල්ලක් නොපවතින්නේ එ බැවිනි.

**ආශ්‍රෙය ග්‍රන්ථ**


ගොඩකුඹුර, සී. ඊ., (1980) මැටි රූප, කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

ගුණවර්ධන, පී., (1994). පුළුටු මැටි රූප. කලා සගරාව ජනවාරි-මාර්තු, කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව. 12-15 පිටු.

ද සිල්වා, ආර්. එච්., (1980). පුරාවිද්‍යා වාර්ෂික පාලන වාර්තාව 1968-69. කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

ද සිල්වා, ආර්. එච්. (1984). පුරාවිද්‍යා වාර්ෂික පාලන වාර්තාව 1970-77. කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

දැරණියගල, පී. ඊ. පී. (1958). පුරාවිද්‍යා වාර්ෂික පාලන වා්රතාව 1957. කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

දිසානායක, එස්. (2000). හත්තොට අමුණ පුරාවිද්‍යා ගවේෂණ. ගවේෂණ I කලාපය. කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, 266-335 පිටු.

දිසානායක, එස්. (2001). යාපහුව. කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

ප්‍රේමතිලක, පී. එල්. (1982). ආළාහණ පරිවෙණ - පොළොන්නරුව තුන්වැනි පුරාවිද්‍යා කැණීම් වාර්තාව. කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල.

Deraniyagala, P.E.P. (1953). Ferrolithic or Early Historic Terracotta Statuary and a Cist from Ceylon. Zeylanica, Vol. 27. Colombo: Department of National Museums, Plate 1.

Deraniyagala, P.E.P. (1960). The Maradanmaduwa-Tabbowa Culture of

Ceylon. Spolia Zeylanica Vol.29. Colombo: Department of National Museums. Plate1.

Deraniyagala, P.E.P. (1961). Some New Record of the Tabbowa-Maradanmaduwa Culture of Ceylon. Spolia Zeylanica Vol. 29(2). Colombo: Department of National Museums, plate 2.

Deraniyagala, S.U. (1972). The Age of the Terracotta Objects of the Maradanmaduwa Phallic Culture. Ancient Ceylon No. 02. Colombo: Archaeological Department, pp.164-165.

Hocart, A.M. (1924) Archaeological Summery. Ceylon Journal of Science (G) vol. 1, Part 1, Colombo: Government of Ceylon, p.10.

Manatunga, A. (1990) The Maradanmaduwa-Tabbowa Culture Terracottas Found at Manawewa in the Vicinity of Inamaluwa. The Settlement Archaeology of Sigiriya-Dambulla Region. Colombo: The PÈtgraduate Institute of Archaeology, pp. 239-240.

Nandadeva, B.D. (1990a) The Illukwewa Terracotta Figurines. The Settlement Archaeology of Sigiriya-Dambulla region. Colombo: The PÈtgraduate Institute of Archaeology, pp. 221-235.